# සුනත්‍ය ඉගෙනුම, ඉගැන්වීම හා තක්සේරුකරණය

රෝලන්ඩ් අබේපාල

## හැඳින්වීම

පශ්චාත් නූතනවාදී චින්තනය විසින් කලාව දේශපාලනය ආර්ථිකය මෙන් ම අධ්‍යාපනය ද යළි විමසීමට ලක් කරයි. පවතින අධ්‍යාපනය හුදෙක් ශිෂ්‍යයන්ගේ මොළ දැනුමින් පුරවන නමුදු සම්පූර්ණ මොළයේ ක්‍රියාකාරීත්වය ප්‍රයෝජනයට නො ගන්නා බව සාම්ප්‍රදායික අධ්‍යාපනයට එල්ල වන ප්‍රබල දෝෂාරෝපණයකි. ඊට විකල්ප විසඳුම ලෙස ඉදිරිපත් වන්නේ Authentic learning හෙවත් සුනත්‍ය ඉගෙනුම යි.

සුනත්‍ය ඉගෙනීම යනු සැබෑ ජීවිතය ඉගෙනීම ය. ජීවත්වන ලෝකයට තමන් අයත් බවත්, එහි පැන නැඟෙන ගැටලු හා තත්වයන් ස්පර්ශ කර ගනිමින් නිර්මාණයට හෝ නිෂ්පාදනයට සක්‍රීය ලෙස දායක වීම ඉන් අපේක්ෂා කෙරේ. එසේ ලබන ක්‍රියාකාරී අවබෝධය මැනුම පිණිස සාම්ප්‍රදායික විභාග හා පරීක්ෂණ අභිභවන සුනත්‍ය තක්සේරුව. (Authentic Assessment) භාවිත කෙරෙයි.

ලොව අධ්‍යාපන ක්ෂෙත්‍රයේ නව භාවිතයන් වන ''සුනත්‍ය ඉගෙනුම, සුනත්‍ය ඉගැන්වීම හා තක්සේරුකරණය, යන නූතන සංකල්ප මේ වන විටත් අප රටට ප්‍රවේශ වෙමින් පවතී. ගුරු අධ්‍යාපන පාඨමාලා විෂය නිර්දේශවල අදාළ විෂයන් උගන්වන ආචාර්යවරුන්ට ඒවා මගහැර යන්නට නො හැකි වෙයි. ඒ නිසා උගන්වන මෙන් ම ඉගෙන ගන්නා විද්‍යාර්ථීන්ට ද මෙම සංකල්ප පිළිබඳ අවබෝධය අත්‍යවශ්‍ය බව පෙනී යයි. සුනත්‍ය ඉගෙනීම යන්නට නිර්වචන අප්‍රමාණ සංඛ්‍යාවක් තිබේ. එහෙත් ඒ සියල්ලෙහි ම හරය වනුයේ, ''ශිෂ්‍යයන් අදාළ සහ සැබෑ ලෝක ඉගෙනීමක නිරත කරවමින් ඔවුන් ඉගෙන ගන්නා දෙය අර්ථවත් කිරීම'' යන්න ය.

## ⋆ පද නිර්වචනය

Authentic යනු ග්‍රීක බසින් ඉංග්‍රීසියට ආදේශ වූ වදනක් ලෙස සැලකේ. මෙම වචනයට සිංහල අර්ථ ගෙන දෙන ශබ්ද කෝෂ, තථ්‍ය, නිර්ව්‍යාජ, අව්‍යාජ, විශ්වසනීය, නිසැක, යථාභූත, සත්‍ය, විශ්වාස කටයුතු යනාදී අරුත් ගණනාවක් සපයනු ලබයි. අධ්‍යාපන ක්ෂේත්‍රයේ දැනටමත් මේ සඳහා 'සුනත්‍ය' යන යෙදුම්

භාවිත කරයි. මේ සියලු යෙදවුම්වල පොදු අර්ථය සමඟ ඉගෙනුම යන වචනය සම්බන්ධ වී ''සුතත්‍ය ඉගෙනුම'' (Authentic Learning) යන යෙදුම භාවිත කෙරේ. එයින් ගම්‍යමාන අදහස නම්. සැබෑ ලොව යථාර්ථය තුළින් පැන නැඟෙන දැනුම ආකල්ප, කුසලතා ක්‍රියාකාරකම් හෙබි මානව හැසිරීම් පිළිබඳ අත්දැකීම් වඩවා ගැනීමක් වශයෙන් සැලකිය හැකි ය.

සුතත්‍ය ඉගෙනීමෙහි නිර්මාතෘ ස්ටීව් රෙවින්ටන් (Steve Revington) පවසන අන්දමට සුතත්‍ය ඉගෙනීම යනු "සැබෑ ජීවිත ඉගෙනීම යි. එය, තමන්ගේ ලෝකය සමඟ හවුලේ ප්‍රයෝජනයට ගතහැකි නිශ්චිත, ඵලදායී නිෂ්පාදනයක් නිර්මාණය කිරීමට ශිෂ්‍යයන් දිරිගන්වන අන්දමේ ඉගෙනීමේ ශෛලියකි."

## සුතත්‍ය ඉගෙනීම යනු කුමක් ද? What is authentic learning

සුතත්‍ය ඉගෙනුම යනු, ශිෂ්‍යයනට පාසලේ දී උගන්වනු ලබන දෙය සැබෑ ලෝක තත්වයනට, ගැටලු සහ අවස්ථාවනට සම්බන්ධනය කිරීමට හැකි වන අන්දමින් සැලසුම් කරනු ලබන ඉගෙනුම ය. ඉගෙනුම් අත්දැකීම් මගින් සැබෑ ජීවිතයෙහි සංකීර්ණතා සහ අනේකාර්ථතාවන් පිළිබිඹු විය යුතු ය. මෙම ඉගෙනුම් ක්‍රමය තුළ ශිෂ්‍යයන් කටයුතු කරනුයේ, පාසල තුළ සාර්ථකත්වය ඉක්මවා යන වටිනාකමකින් යුත් කතිතාවන්, නිර්මාණයන් සහ කාර්ය සාධනයන් ඉලක්ක කර ගනිමිනි. "කාර්යයෙහි නිරත වීම ඔස්සේ ඉගෙනීම" (learning by doing) යනු එය යි.

"ඉගෙන ගත් දෙය අමතක ව ගිය පසු ඉතිරි වන යමක් වේ ද, එය අධ්‍යාපනය යි. යනුවෙන් එක්තරා කාලයක දී කියන ලදි. (Education is what survives when what has been learnt has been forgotten) අර්ථයක් දැක ගැනීමට ළමයින් දිරිමත් නො කෙරෙන අන්දමේ ඉගෙනුම් අත්දැකීම් ඉක්මනින් ම අමතක වී යයි. ඕනෑම ඉගෙනුම් අවස්ථාවක අරමුණ විය යුත්තේ, සෑම කාර්යක්, පාඩමක් සහ ඒකකයක් තුළට ම සුතත්‍යතාව කාවැද්දීම ය. එ මගින්, ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව මෙන් ම, තමන් සතු ඉගෙනීමේ හැකියාව පිළිබඳ ආත්ම විශ්වාසය ද ශිෂ්‍යයන් තුළ සංවර්ධනය වනු ඇත. **(Nicaise and Crane, 2000**) තමන් ඉගෙන ගත් කුසලතා සහ දැනුම පන්තිකාමර සීමාවන්ට ඔබ්බෙන් ප්‍රයෝජනයට ගැනීමට ළමුනට හැකි වන්නේ එම ආත්ම විශ්වාසය ඇති වූ විට පමණකි.

පාසල් සීමාවෙන් පිටත ජීවිතයට සිසුන් සූදානම් කිරීමට නම්, තමන් ඉගෙනගත් දෙයෙහි අර්ථය දැනගැනීමේ හැකියාව ඔවුන් තුළ සංවර්ධනය කළ යුතු ය. මෙය කළ හැකි වන්නේ ඉහත දී ඉගෙන ගත් දෙය සහ අලුතින් ඉගෙන ගත් දෙය අතර ද, එක් විෂයක් හා තවෙකක් අතර ද පවත්නා සම්බන්ධය අවබෝධ කරවීමෙනි.

සුතත්‍ය ඉගෙනීමේ 'සාරය' ලෙසින් පර්යේෂකයන් විසින් සලකනු ලබන, සැලැසුම් මූලිකාංග දහයක් වෙයි. එම පර්යේෂකයන්ට අනුව, සෑම ඉගෙනුම් අත්දැකීමක් ම පහත සඳහන් ලක්ෂණ සහිත විය යුතු ය.

1. **සැබෑ ජීවිතයට අදාළ වීම** - Real Life Relevants

ක්‍රියාකාරකම් සහ කර්තව්‍යයන් හැකි තරම් දුරට සැබෑ විද්වත් වෘත්තිකයකුගේ ක්‍රියාකාරකම් හා කර්තව්‍යයන්ට සමාන ඒවා විය යුතු ය.

2. **මනාව පැහැදිලි නො කරන ලද ගැටලුවක්** - An Illdefined Problem

පැහැදිලි පිළිතුරක් නොමැති හෝ පහසුවෙන් නිරාකරණය කළ නො හැකි හෝ අභියෝග ගැටලුව විසඳීමට නම්, සම්පූර්ණ කළ යුතු කර්තව්‍යයන් ගණනාවක් ම තිබිය හැකි ය.

3. **දිගු කලක් ගන්නා විමර්ශන** - Sustained Investigation

විනාඩි ගණනක් හෝ පැය කිහිපයක් ඇතුළත නිම කළ නො හෙන ව්‍යාපෘති සහ කර්තව්‍යයක්

4. **බහුවිධ මූලාශ්‍රය සහ පර්යාලෝක** - Multiple & Perspectives

මූලාශ්‍රය න්‍යායික හෝ ප්‍රායෝගික හෝ ඒවා විය හැකි ය. අදාළ නො වන තොරතුරු ඉවත ලා ප්‍රයෝජනවත් තොරතුරු පමණක් තෝරා ගැනීමට ශිෂ්‍යයාට සිදු වෙයි.

5. **සහයෝගීතාව** - Collaboration

පුද්ගලයනට තනි තනි ව සාර්ථකත්වය අත්කර ගත නො හැකි ය. ව්‍යාපෘතීන් සහ කර්තව්‍යයන් සඳහා සමාජයීය සම්බන්ධයන් අවශ්‍ය වෙයි.

6. **ප්‍රත්‍යාවේක්ෂණය** - Reflection

ශිෂ්‍යයන් තමන් විසින් ඉගෙනගන්නා ලද දේ වෙත නැවත අවධානය යොමු කර, ඒ අනුව ගත යුතු ක්‍රියාමාර්ග තීරණය කර ගනු ඇත. ඉලක්ක පිහිටුවා ගනු ඇත.

7. **විෂයාන්තර පර්යාලෝකයක් -** An Interdisciplinary Perspective

ව්‍යාපෘති එක් විෂයකට පමණක් සීමා නො වූ, විෂයාන්තර දැනුම අවශ්‍ය වන ඒවා විය හැකි ය.

8. **සමෝධානගත තක්සේරුව -** Integrated Assessment

මෙහි දී, සියලු කර්තව්‍යයන් සහ ක්‍රියාකාරකම්හි සාර්ථකතා හෝ අසාර්ථකතා මට්ටම සැලකිල්ලට ගනු ලැබෙයි.

9. **නිමි නිෂ්පාදිතයන්** - Polished Products

ක්‍රියාකාරකම් සහ කර්තව්‍යයන් මගින් නිෂ්පාදිතයකට (ප්‍රතිඵලයකට) මඟ පැදෙනු ඇත.

## 10. බහුවිධ අර්ථකථන සහ ප්‍රතිඵල - Multiple Interpretation and Outcomes

ගැටලුවකට අදාළ ව බොහෝ විසඳුම් සහ පිළිතුරු ඇත **(Lombardi, 2007)**.

## සුතත්‍ය ඉගෙනුමෙහි අංග - Aspects of Authentic Learning

### * සුතත්‍ය ඉගෙනුම සක්‍රිය ක්‍රියාවලියක් ලෙසින්

ශිෂ්‍යයෝ හුදෙක් ම තම අසුන්වල නිහඬ ව වාඩි වී දේශන එකින් එකට සවන් දෙමින් නො සිටිති. මෙය ගුරුවරයා විසින් මෙහෙයවනු ලබන ඉගෙනීමක් නො වේ. එය ශිෂ්‍යයා විසින් මෙහෙයවනු ලබන ඉගෙනීමකි. ඔවුහු ක්‍රියාකාරී ව තමන් අවට ලෝකය ගවේෂණය කරමින් සිටිති.

### * ස්වයං මෙහෙයුම්ගත විමර්ශනය - Self Directed Inquiry

ඔබගේ පන්තිකාමරය තුළ සිදු වන ඉගෙනුම මෙහෙයවනු ලබන්නේ ශිෂ්‍යයන්ගේ ප්‍රශ්න සහ කුතුහලයන් මගින් ය. ඔවුන් අසන ප්‍රශ්නවලට පිළිතුරු දීමේ දී, ඔබගේ පාඩම් ගවේෂණ සහ පර්යේෂණමය ස්වරූපයක් ගනියි.

### * ගැටලු විසඳීම

මෙහි දී විසඳීමට සිදු වන ගැටලු වනුයේ. ඔබගේ ශිෂ්‍යයන් මුහුණ දී සිටින හෝ ඔවුන් අයත් ප්‍රජාව තුළ හෝ ඉන් ඔබ්බට ද ඔවුනට දක්නට ලැබෙන සැබෑ ලෝක ප්‍රශ්න වෙයි. එම ප්‍රශ්න විසඳීමට කටයුතු කිරීමේ දී සමාජ සාධාරණත්වය පන්තිකාමරය තුළ විශාල භූමිකාවක් ඉටු කරයි. ඒ සඳහා ශිෂ්‍යයන් වෙතින් ඉහළ මට්ටමේ චින්තනයක් අවශ්‍ය වෙයි.

## සුතත්‍ය ඉගෙනුම් වෙත ඔබ යන ගමන

1. ඔබගේ ශිෂ්‍යයන් හඳුනා ගන්න.

   ඔබ මෙම ප්‍රශ්න ඔබගෙන් ම අසන්න.

- මගේ ශිෂ්‍යයන් එන්නේ කොහි සිට ද?
- ඔවුන්ගේ පවුල් ගතික/සමාජාර්ථික තත්වය/ සංස්කෘතිය කෙබඳු ද?
- එක් එක් ශිෂ්‍යයා විනෝදය සඳහා කුමක් කරන්නේ ද? කියවීම ද? යම් යම් දේ සෑදීම ද? රූපවාහිනිය නැරඹීම ද? නොයෙකුත් දේ කෑම ද? යනාදී වශයෙනි.

ශිෂ්‍යයන් සමඟ කථාකිරීම මගින් එම ප්‍රශ්නවලට පිළිතුරු සපයාගත හැකි ය. එම පිළිතුරු ඔස්සේ, ශිෂ්‍යයන් හා සම්බන්ධනය වන පාඩම් ඉදිරිපත් කිරීමට ඔබට හැකිවෙයි.

- ශිෂ්‍යයන්ගේ පවුල් හඳුනා ගන්න ශිෂ්‍යයන් හඳුනා ගැනීම මෙන් ම, ඔවුන්ගේ පවුලේ අය හඳුනා ගැනීම ද වැදගත් ය.

- පවුලේ කී දෙනෙක් සිටිත් ද? ඒ කවුරු කවුරුන් ද?
- ඔවුහු කුමක් කරත් ද?
- ඔවුන් සාමූහික ව සතුටින් සිදු කරන ක්‍රියාකාරකම් මොනවා ද? පාසල් වර්ෂය ආරම්භයේ දී ම, ශිෂ්‍යයන්ගේ පවුලේ සාමාජිකයන්ගේ හමුවක් පැවැත්වීම ඉතා ප්‍රයෝජනවත් විය හැකි ය.
- ශිෂ්‍යයන් අයත් වන ප්‍රජාව හඳුනා ගන්න. ඔබ වෙනත් ප්‍රදේශයකට අයත් අයකු නම්, එය ඉතා ප්‍රයෝජනවත් වෙයි.
- එම ප්‍රජාවට අයත් ජනවර්ග මොනවා ද?
- එම ප්‍රජාව වඩාත් ප්‍රකට ව ඇත්තේ කුමක් සම්බන්ධයෙන් ද?
- එම ප්‍රජාව පොදුවේ මුහුණ දී සිටින ප්‍රශ්න සහ ගැටලු මොනවා ද?
- ඔබගේ පාසල සහ ඔබ ම (තමා ම) හඳුනා ගන්න.

ඔබගේ පුද්ගලික විශ්වාසයන්, ඔබ අයත් ප්‍රජාව සහ ඔබගේ ශිෂ්‍යයන් පිළිබඳ ව විවේකී ව සිතන්න. ඔබ තමාගෙන් ම පහත සඳහන් ප්‍රශ්න අසා ගන්න.

- ඉගෙනීම පිළිබඳ ව මා දරන යල් පිනූ මත මොනවා ද ?
- ඉගෙනීම පිළිබඳ ව මගේ පාසල පොදුවේ දරන මතය කෙබඳු ද?
- කවර ඉගෙනුම් වැඩ සටහන් දැනටමත් ක්‍රියාත්මක වෙමින් තිබේ ද?
- ඉගෙනුම වඩාත් අර්ථවත් වනු සඳහා එම වැඩසටහන් සංශෝධනය කළ යුතු ද? එසේ නම් ඒ කවර අන්දමින් ද?
- සුනත්‍ය ඉගෙනුමට සහාය වෙමින් දැනටමත් ක්‍රියාත්මක වන ඉගෙනුම් වැඩ සටහන් මොනවා ද?
- මගේ පංතිකාමරය තුළ සුනත්‍ය ඉගෙනීම ක්‍රියාත්මක කිරීමට බාධා කරන අවහිරතා මොනවා ද?

## සුනත්‍ය ඉගෙනුම් අත්දැකීම් සැලසුම් කළ යුතු අන්දම

සුනත්‍ය ඉගෙනුම් අත්දැකීම් සැලසුම් කිරීම සඳහා නියමිත විශේෂ සූත්‍රයක් නොමැත. ගුරුවරයාගේ මඟ පෙන්වීම හුදෙක් මඟ පෙන්වීමක් පමණක් ම විය යුතු ය. ගුරුවරයෙකු වශයෙන් ඔබගේ ශිෂ්‍යයන් පිළිබඳ ව හොඳින් ම දැන සිටින පුද්ගලයා ඔබ ය.

1. ඔබගේ ශිෂ්‍යයන් මනාව හඳුනා ගන්න. ඔවුන්ගේ විශේෂ ළැදියාවන් මොනවා ද? ඔවුන් වඩාත් ම නිරත වන්නේ කවර ක්‍රියාකාරකම්හි ද? ප්‍රමුඛස්ථානය දිය යුත්තේ ඔබගේ ශිෂ්‍යයාගේ අවශ්‍යතාවන්ට සහ ළැදියාවන්ට ය.

2. ශිෂ්‍යයන්ගේ රුචි අරුචිකම් සහ දක්ෂතා සැලකිල්ලට ගනිමින්, යෝග්‍ය ව්‍යාපෘතියක්, ඉලක්කයක් හෝ ප්‍රතිඵලයක් පිළිබඳ ව නිගමනය කරන්න සුතත්‍යතාව (Authenticity) සහ අදාළත්වය පැහැදිලි ව දක්නට ලැබෙන්නේ මෙහි දී ය. ව්‍යාපෘතියෙහි ප්‍රතිඵලය, සැබෑ ජීවිතයෙහි කිසියම් දෙයකට සම්බන්ධ කර ගන්න. එය වෙළඳසැලක් පවත්වා ගෙන යාම, ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කිරීම, පුස්තකාලයක් ආරම්භ කිරීම, පරිසර ගැටලුවක් නිරාකරණය කිරීම ආදි ඕනෑම දෙයක් විය හැකි ය.

3. ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා ශිෂ්‍යයන් සතු ව තිබිය යුතු කුසලතා කොටස් කරන්න. මේවා විවිධ විෂය ක්ෂේත්‍රයන්ට අදාළ කුසලතා විය හැකි ය.

4. ශිෂ්‍යයාගේ කුසලතා කල් තබා තක්සේරු කර ගන්න ඔවුන් ඒ වනවිටත් එම කුසලතා පෙන්නුම් කරන්නේ කවරාකාරයෙන් ද? මෙම කුසලතා තක්සේරු කර ගැනීම සඳහා හොඳම ක්‍රමය නම් ළමයින් සමඟ කථා කිරීම ය. ඔවුන්ට අවශ්‍ය මොනවාදැයි දැන ගන්න. ඉන්පසු ඔවුන්ගේ කුසලතාවන්ට ගැළපෙන අන්දමින් ව්‍යාපෘතියට අදාළ කාර්යභාරයන් ඔවුන්ට පවරන්න.

5. AMT ආකෘතියට අනුව ක්‍රියාකරන්න කලින් අත්කරගෙන ඇති කුසලතා අදාළ ව්‍යාපෘති කාර්ය වෙත ස්ථාන මාරුවකට ඉඩ සලසන්න.

6. උගන්වන්න පහසුකම් සලසන්න. මඟ පෙන්වන්න. එ මගින් ඔබ ද ඉගෙන ගන්න. ව්‍යාපෘති කාර්යෙහි සෑම පියවරක් ම තක්සේරු කරන්න. එක් පියවරකින් පසු, ඊළඟ පියවර තමන් විසින් ම තීරණය කරගැනීමට සිසුනට උදව් වෙන්න. ධනාත්මක ඉගෙනුම් චර්යාවන් (Positive Learning Behaviours) ආදර්ශයට ගන්න.

7. ව්‍යාපෘතිය අවසානයෙහි එය තක්සේරු කිරීමේ කාර්ය ද ශිෂ්‍යයනට පැවරීම වඩාත් උචිත ය. ඔවුන් අලුතින් ඉගෙනගෙන තිබෙන්නේ මොනවා ද? ඔවුන් අත්කරගෙන ඇති නව කුසලතා කවරේ ද? ඔවුන් තවදුරටත් දැන ගැනීමට කැමති කරුණු මොනවා ද?

සුතත්‍ය ඉගෙනීම හා සම්බන්ධ තවත් මූලධර්මයක් නම් එ මගින් සැබෑ ජීවිතයෙහි සංකීර්ණතා සහ විවිධාර්ථවත් භාවයන් (Ambiguities) පිළිබිඹු වන බව ය. බහුවරණ විද්‍යා ප්‍රශ්න පත්‍රයක ඇතුළත් වනුයේ ප්‍රශ්න පත්‍රය සාදන්නන් විසින් කලින් නිර්ණය කරනු ලබන 'නිවැරදි' හෝ 'වැරදි' පිළිතුරු ය. සුතත්‍ය ඉගෙනීමේ දී පිළිතුරු සැපයිය යුත්තේ එසේ කලින් නියම කරගත් පිළිතුරු නොමැති සංකීර්ණ ප්‍රශ්නවලට ය. සුතත්‍ය ඉගෙනුමෙහි අරමුණ වනුයේ, ගැඹුරින් සිතීමට, දුෂ්කර ප්‍රශ්න මතු කිරීමට විවිධාකාරයේ සාක්ෂි සලකා බැලීමට සහ පරස්පරයන් (Contradictions) විමර්ශනය කිරීමට ද ශිෂ්‍යයා පුරුදු පුහුණු කිරීම ය. සුතත්‍ය ඉගෙනුමෙහි උච්චතම ඵලය වනුයේ ශිෂ්‍යයන් විසින් තමන්ගේ ප්‍රජාව හෝ අධ්‍යයන ක්ෂේත්‍රය වෙත ඉතාමත් ම ප්‍රයෝජනවත් ප්‍රදානයක් සිදු කරනු ලැබීම ය.

සුතත්‍ය ඉගෙනුම යනු ''අභිනිර්මාණවාදී ඉගැන්වීම'' (Constructivist teaching) නමැති සංකල්පය හා න්‍යාය සමඟ සමීප ව සම්බන්ධ වන්නක් වන අතර, ඇතැම් අවස්ථාවන්හි දී ඒවා සමානාර්ථයෙන් ද භාවිත කෙරෙයි.

පාසල් ප්‍රතිශෝධන සංකල්පයක් වශයෙන් ගත් විට, සුතත්‍ය ඉගෙනුම යනු පුද්ගලාරෝපිත ඉගෙනීම (Personalized learning) ප්‍රජාපාදක ඉගෙනීම (Community based learning) සහ ව්‍යාපෘති පාදක ඉගෙනීම (Project based learning) ආදි ඉගෙනීමේ ක්‍රම හා සම්බන්ධ වන්නකි. ඊට අමතර ව, ඉගෙනුම් නිරූපණ (Demonstrations of learning) අග්‍ර ඵල ව්‍යාපෘතිය (Capstone project) පුද්ගලික ඉගෙනුම් සැලසුම් (Personal learning plans) සහ පුද්ගල නිර්මාණ (Profolios) යනාදිය ද සුතත්‍ය ඉගෙනුම් හා සම්බන්ධ වනු ඇත.

ශිෂ්‍යයනට මුලු ජීවිත කාලය පුරා ම, ආධ්‍යාපනික රැකියා සහ ප්‍රජා පසුතලයන්හි දී මෙන් ම සියලු ම විෂයන්හි දී ද ප්‍රයෝජනවත් වන කුසලතා බිහි කරන අධ්‍යාපන ප්‍රතිශෝධනයක් සඳහා පවත්නා ඉල්ලුමට ද සුතත්‍ය ඉගෙනුම් ක්‍රමය පිළිතුරු සපයයි. එසේ ම, 21 සියවසට අවශ්‍ය කුසලතා බිහි කිරීමට ද, සාම්ප්‍රදායික ඉගැන්වීමේ ක්‍රමයට වඩා සුතත්‍ය ඉගෙනුම් ක්‍රමය සමත් වන බව ද පිළිගනු ලැබ ඇත.

## සුතත්‍ය ඉගෙනුමෙහි විශේෂ ලක්ෂණ

සුතත්‍ය ඉගෙනුමට අදාළ විශේෂ ලක්ෂණ ගණනාවක් ඇත. ඒවායින් කිහිපයක් මෙසේ ය.

1. සුතත්‍ය ඉගෙනුමට කේන්ද්‍රීය වනුයේ ශිෂ්‍යයන් කැමැත්තක් දක්වන තථ්‍ය අත්දැකීම් හා ඊට අදාළ තථ්‍ය ලෝක කර්තව්‍යයන් ය.
2. ශිෂ්‍යයෝ ක්‍රියාකාරී ව ගවේෂණයෙහි සහ විමර්ශනයෙහි නිරත වෙති.
3. ඉගෙනීම බොහෝ විට විෂයාන්තර (Interdisciplinary) වේ. විෂයන් ගණනාවක සමෝධානය අවශ්‍ය වන අතර, ඉන් දැක්වෙන ප්‍රතිඵල විෂය ක්ෂේත්‍රය ඉක්මවයි.
4. ඉගෙනීම පන්තිකාමරයෙන් පිටත ලෝකය හා සමීප ව සම්බන්ධනය වේ.
5. තොරතුරු විශ්ලේෂණය කිරීම, සංශ්ලේෂණය කිරීම, සැලසුම් කිරීම, පරිහරණය කිරීම සහ අගැයීම වැනි සංකීර්ණ කාර්යන්හි සහ ඉහළ මට්ටමේ චින්තන කාර්යන්හි ශිෂ්‍යයෝ නිරත වෙති.
6. ඉගෙනුම ඇරඹෙනුයේ ප්‍රශ්නයකින් හෝ ගැටලුවකිනි. ඊට තමන්ගේ ම ප්‍රතිචාරය දැක්වීමට හෝ එය විමර්ශනය කිරීමට ශිෂ්‍යයාට ඉඩ සැලසෙන හෙයින් ඔහු හිරවීමකට ලක් නො වෙයි. එම ඉගැන්නුම් අත්දැකීමෙහි ප්‍රතිඵලය කල්තබා නිගමනය කළ හැකි නො වේ.
7. පන්තිකාමරයෙන් පිටස්තර අය සමඟ ද පරිහරණය කළ හැකි නිර්මාණයක්

හේ ඉදිරිපත් කරයි. හුදෙක් ඉහළ ශ්‍රේණියක් දිනා ගැනීම ඉක්ම වූ අගයක් එම නිර්මාණයෙහි තිබේ.

8. මෙකී නිර්මාණ අගය කිරීමට හෝ විවේචනය කිරීමට සෙස්සන්ට ඉඩ ලැබේ. එය ශිෂ්‍යයා ලබන ප්‍රතිපෝෂණයකි.

9. ඉගෙනුම මෙහෙයවනු ලබන්නේ ශිෂ්‍යයා විසින් ම වන අතර, සම්පදස්ථයෝ, ගුරුවරු, මාපියන් සමඟ බාහිර විශේෂඥයන් ද එම ඉගෙනුම් ක්‍රියාවලියට සහාය වෙති.

10. සමාජයීය කතිකාව, සහයෝගීතාව සහ ප්‍රත්‍යාවේක්ෂණය (reflection) සඳහා ශිෂ්‍යයාට අවස්ථාව තිබේ.

11. අවශ්‍ය තරම් සම්පත් සලස්වනු ලබයි.

12. සුතත්‍ය ඉගෙනුම් තක්සේරුව, ඉගෙනුම් කර්තව්‍යය තුළ ම සිදුවෙයි. එහි දී ඒ හා සමාන සැබෑ ලෝකයේ තක්සේරුකරණයට වඩා එය වෙනස් වූවකි.

13. අදාළ ගැටලුව විවිධ පර්යාලෝක තුළින් පරීක්ෂාකර බැලීමේ අවස්ථාව ශිෂ්‍යයාට තිබේ. ඒ හේතුවෙන් එක් නිවැරදි පිළිතුරක් නො ව, විවිධ තරඟකාරී පිළිතුරු ඉදිරිපත් කිරීමට ඉඩ සැලසේ.

14. තමන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය පිළිබඳ ව හෝ ඉගෙනුම් ප්‍රතිඵලය ගැන හෝ අදහස් ප්‍රකාශ කිරීමට ශිෂ්‍යයාට ඉඩ ලැබෙයි.

**සුතත්‍ය ඉගෙනුම් ප්‍රයෝජන කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.**

- තමන් ඉගෙනගන්නා දෙය පාසලෙන් පිටත තමන්ගේ ජීවිතයට අදාළ වන විට ශිෂ්‍යයෝ ඉගෙනීම වෙත වැඩි වැඩියෙන් අභිප්‍රේරණය වෙති. උනන්දුවක් දක්වති.
- උසස් අධ්‍යාපනයේ දී රැකියාවේ දී සහ වැඩිහිටි ජීවිතයේ දී වඩාත් සාර්ථක ව කටයුතු කිරීමට ශිෂ්‍යයෝ සූදානමින් සිටිති.
- නුහුරු දැනුම රැස්කර ගැනීමට සහ සම්බන්ධනය කිරීමට ශිෂ්‍යයෝ උගනිති.
- විවිධ පසුතල, ක්‍රියාකාරකම් සහ පර්යාලෝක තුළට ශිෂ්‍යයෝ ගෙන යනු ලබති.
- න්‍යායයික දැනුම පන්තිකාමරයෙන් පිටත ලෝකය තුළට ගෙනයාමට ශිෂ්‍යයෝ සමත් වෙති.
- සහයෝගයෙන් කටයුතු කිරීමට, භාණ්ඩ නිෂ්පාදනය කිරීමට සහ ගැටලු විසඳීමේ කුසලතා හා වෘත්තීය කුසලතා භාවිතයෙහි යෙදීමට ශිෂ්‍යයෝ අවස්ථාව ලබති.

- සුරක්ෂිත පරිසරයක් තුළ වෘත්තීය විනිශ්චයන් ක්‍රියාවට නැඟීමට ශිෂ්‍යයනට අවස්ථාව පැදේ.
- ඉහළ මට්ටමේ චින්තන කුසලතා අභ්‍යාස කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලැබේ.
- ඉවසීමෙන් යුතු ව තර්කයන්ට මුහුණ දීමට ශිෂ්‍යයෝ පුරුදු වෙති.

**★ "සුතත්‍ය ඉගෙනුමෙහි" ගුණාංග හා වාසි**

'සුතත්‍ය ඉගෙනුම' යනු සැබෑ ජීවිත සන්දර්භයන් සහ අවස්ථාවන් තුළ දැනුම යොදවමින් ඉගෙන ගැනීම විස්තර කරන සාපේක්ෂ වශයෙන් අලුත් යෙදුමකි. 'State University of NewYork' හි ප්‍රකාශ කරන අන්දමට, සුතත්‍ය ඉගෙනුම තුළ නිරන්තර ව දැකිය හැකි සංරචකයන් හතරක් වෙයි. එ නම්,

1. සැබෑ ලෝක ගැටලු සම්බන්ධ කරගන්නා වූ ද, වෘත්තිකයන්ගේ කාර්යන් අනුකරණය කරන්නා වූ ද ක්‍රියාකාරකමකි. සොයා ගනු ලබන කරුණු පන්තිකාමරයෙන් ඔබ්බෙහි ශ්‍රාවකයන් වෙත ඉදිරිපත් කිරීම ඇතුළත් ක්‍රියාකාරකමකි.
2. නිශ්චිත පූර්ව නිගමනයකින් තොර විමර්ශනය, චින්තනය කුසලතා සහ හර - ප්‍රජානනය (Metacognition) භාවිත කෙරෙයි.
3. ශිෂ්‍යයෝ, ශිෂ්‍ය ප්‍රජාවක් තුළ සිටිමින් කතිකාවතක සහ සමාජයීය ඉගෙනීමක නිරත වෙති.
4. ශිෂ්‍යයෝ තමන් විසින් ම ව්‍යාපෘති කාර්ය ඔස්සේ ඉගෙනීම කරති.

**★ සුතත්‍ය ඉගෙනුම් ක්‍රමයේ වාසි :**

'සුතත්‍ය ඉගෙනුම' යනු, පාසලේ දී සහ විශ්වවිද්‍යාලයේ දී ශිෂ්‍යයන්ට උගන්වනු ලබන විෂයන්, සැබෑ ලෝකයට සම්බන්ධනය කරනු සඳහා සැලසුම් කරනු ලබන, ඉගැන්වීමේ ක්‍රමෝපායන් විස්තර කිරීමට භාවිත කෙරෙන යෙදුමකි. තමන් ඉගෙන ගනිමින් සිටින දේවල අදාළත්වය ද, තම කුසලතා වෘත්තීය ලෝකය තුළ යෙදවිය හැකි අන්දම ගැන ද අවබෝධ කර ගැනීමට සුතත්‍ය ඉගෙනුම් අත්දැකීම් ශිෂ්‍යයන්ට උපකාරී වෙයි. උපකල්පිත අවස්ථාවන් පිළිබඳ ව සාකච්ඡා කිරීම හෝ තොරතුරු කටපාඩම් කිරීම හෝ වෙනුවට, තමන්ගේ කුසලතා සහ දැනුම ප්‍රායෝගික ව ප්‍රයෝජනයට ගැනීමට සුතත්‍ය ඉගෙනුමේ දී ශිෂ්‍යයන්ට අවස්ථාව ලැබෙයි.

මෙම ඉගැන්වීමේ හා ඉගෙනීමේ ක්‍රමය ශිෂ්‍යයන්ට ප්‍රයෝජනවත් වන විධි 10ක් පහතින් සඳහන් වේ.

1. **එ මගින් ශිෂ්‍යයෝ සැබෑ ලෝකයට සූදානම් කරනු ලබති:** සුතත්‍ය ඉගෙනුමෙහි ඉතාමත් ම වැදගත් යහඵලය නම්, සාම්ප්‍රදායික පන්ති කාමර පාදක ඉගෙනුමට වඩා ඵලදායී ලෙස, ශිෂ්‍යයන් සැබෑ ලෝකයට සූදානම් කරනු ලැබීම ය. සුතත්‍ය ඉගෙනුම ලබන ශිෂ්‍යයන්ගේ

ක්‍රියාකාරකම් පිළිගත් වෘත්තිකයන්ගේ ක්‍රියාකාරකම්වලට බෙහෙවින් සමාන වෙයි. එ හෙයින් ශ්‍රම බලකායට බැඳුණු පසු තමන්ට නියමිත කාර්ය කුමක් ද යනු පිළිබඳ ව ඔවුහු අවබෝධයකින් යුතු ව සිටිති.

2. **මැනවින් සිතා බලා රැකියා තෝරා ගැනීමට ශිෂ්‍යයන්ට එය උපකාරී වෙයි:** කවර තරාතිරමේ පුද්ගලයන් විය යුතු ද යනු පිළිබඳ ව අවබෝධයක් සාම්ප්‍රදායික අධ්‍යාපනය ලබා යොවුන් වියට පත් අපට තිබුණේ නැත. සුතත්‍ය ඉගෙනුම් අත්දැකීම් වැදගත් වන්නේ ද එ හෙයිනි. එක්සත් රාජධානියේ විශ්වවිද්‍යාලය මගින් මෑතක දී සිදු කරන ලද පර්යේෂණයකින් අනාවරණය වූ අන්දමට විශ්වවිද්‍යාලයෙන් පිට වූ උපාධිධාරීන් තුනෙන් එකක් විසින් ම තෝරා ගන්නා ලද රැකියාවලට ඔවුහු නො සුදුස්සෝ වූහ.

පර්යේෂකයන් පෙන්වා දෙන අන්දමට එසේ වන්නේ ශිෂ්‍යයන් වැරදි පාඨමාලා තෝරා ගැනීම හේතුවෙන් නො වේ. තමන් සතු කුසලතා සහ හැකියාවන් ඒ ඒ රැකියාවන්ට යෝග්‍ය වන අන්දම පිළිබඳ ව අවබෝධයක් නො තිබීම හේතුවෙනි. සුතත්‍ය ඉගෙනුම ලබන්නෝ, තමන්ගේ හැකියාවන්ට හා කුසලතාවන්ට යෝග්‍ය රැකියාව කල්තබා ම හඳුනා ගනිති.

3. **එ මගින් කුසලතා අතර පරතරය තුරන් වෙයි :** කාලයක් තිස්සේ ම කුසලතා පරතරය වර්ධනය වෙමින් තිබේ. National Australia Bank මගින් මෑතක දී පළ කරන ලද වාර්තාවකින් පෙන්වා දී ඇති අන්දමට, යෝග්‍ය කාර්ය මණ්ඩලයක් තෝරා ගැනීමට නො හැකි වීම හේතුවෙන් කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ආයතනයන්හි කටයුතු අඩාළ වෙමින් පවතී. විශ්වවිද්‍යාලයෙන් පිටවීමට පෙර ව්‍යාපාරික ආයතනයන්ට අවශ්‍ය කුසලතා ශිෂ්‍යයන් තුළ සංවර්ධනය කිරීමේ හැකියාව සුතත්‍ය ඉගෙනුම් ක්‍රමයට තිබේ.

4. **නිර්මාණශීලීත්වය වැඩිදියුණු කිරීමේ හැකියාව :** නිර්මාණශීලී චින්තනය හා සම්බන්ධ ප්‍රජානන සුනම්‍යතාවය (Cognitive flexibility) යනු 21 වන සියවසට අත්‍යවශ්‍ය කුසලතා අතුරින් තවත් එකක් වන අතර සුතත්‍ය ඉගෙනුම් අත්දැකීම් මගින් ශිෂ්‍යයන්ට එම කුසලතාව අත්කර ගැනීමට අවස්ථාව ලැබෙයි. සුතත්‍ය ඉගෙනුමෙහි වැදගත් ලක්ෂණයක් වනුයේ සෑම ගැටලුවකට ම එක් නිවැරදි විසඳුමක් නො ව පිළිගත හැකි විසඳුම් ගණනාවක් තිබීම ය. එම හේතුවෙන් පුළුල් ව සිතීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලැබෙයි.

5. **විචාරශීලී චින්තනය දියුණු කරයි :** තොරතුරු මතකයෙහි රඳවා ගැනීමට උත්සාහ කිරීම වෙනුවට සුතත්‍ය ඉගෙනුමේ දී ප්‍රධාන ගැටලු හඳුනා ගැනීම, ප්‍රශ්න ඇසීම, සංකීර්ණ කල්පන ඉදිරිපත් කිරීම සහ තැත්වරද ක්‍රමය (Process of trial and error) අනුගමනය කිරීම ආදිය මගින් ශිෂ්‍යයන්ගේ විචාරශීලී චින්තනය දියුණු කෙරෙයි.

6. **නිරතවීම සහ පෙළඹ වීම වැඩි කරයි :** තමන් වඩාත් ප්‍රිය කරන වෘත්තියට අදාළ ව න්‍යාය භාවිත කළ හැකි අන්දම සුතත්‍ය ඉගෙනුම මගින් පෙන්වා දෙනු

ලබන හෙයින් එය ශිෂ්‍යයන්ට වඩාත් අදාළ වෙයි. ඉගෙනීම ශිෂ්‍යයන්ට අදාළ වන විට එය ඵලදායී ද වෙයි.

7. **තොරතුරු ධාරණය වැඩි දියුණු කරයි.** : තමන් සිදු කරන කාර්යෙහි අදාළත්වය ශිෂ්‍යයන් විසින් වටහාගනු ලැබූ විට අත්වන තවත් වාසියක් නම්, තමන් විසින් ඉගෙන ගනු ලබන දේ පහසුවෙන් ධාරණය වීම ය. අත්දැකීම් ඔස්සේ ඉගෙනීම මගින් ශිෂ්‍යයන්ගේ ධාරණ ශක්තිය විශාල වශයෙන් වර්ධනය වන බව පර්යේෂණ තුළින් මනාව සනාථ වී තිබේ.

8. **සහයෝගීත්වය සහ කණ්ඩායම් වැඩ ප්‍රවර්ධනය කරයි** : සුතත්‍ය ඉගෙනුමෙහි තව ද විශේෂ ලක්ෂණයක් නම් සැබෑ ලෝකයෙහි බොහෝ කර්තව්‍යයන්ට මෙන් ම එයට ද සහයෝගීතාව සහ එක් ව වැඩ කිරීම අවශ්‍ය වීම ය. සුතත්‍ය ඉගෙනුමෙහි නිරත ශිෂ්‍යයෝ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයන් සමඟ සාකච්ඡා කරමින් එක් ව අත්හදා බැලීම් සිදු කරමින් පිළිගත හැකි යැයි පෙනෙන විවිධ විසඳුම් ඉදිරිපත් කරමින් ආරම්භ කරන ලද කාර්ය සාර්ථක ව නිම කිරීමට උත්සාහ දරති.

9. **එක් ප්‍රස්තුතයක් සම්බන්ධ ව බහුවිධ පර්යාලෝක** : සැබෑ ලෝකයේ දී එක් ප්‍රවේශයක් හෝ විසඳුමක් පමණක් සහිත අවස්ථාවන්ට මුහුණ දීමට අපට සිදු වේ නම් ඒ ඉතාමත් ම කලාතුරකිනි. ඒ වනාහි සුතත්‍ය ඉගෙනුම ඔස්සේ ශිෂ්‍යයන් වටහාගන්නා එක් වැදගත් සත්‍යකි. ඉදිරිපත් වන ගැටලුවකට එකම නිවැරදි පිළිතුරක් සොයා ගැනීමට වෙහෙසෙනු වෙනුවට ගැටලුව දෙස විවිධ කෝණයන් ඔස්සේ බලමින් විවිධ සම්පත් ප්‍රයෝජනයට ගනිමින් පිළිගත හැකි යැයි සිතෙන විසඳුම් ගණනාවක් ම සොයා ගැනීමට ඔවුහු හුරු පුරුදු වෙති.

10. **21 සියවසට අවශ්‍ය කුසලතා ගොඩනඟා ගැනීමට එය උපකාරී වෙයි.** : ඩිජිටල් පුරවැසිභාවය (digital citizenship) කේතකරණය (coding) සහ විචාරශීලී කියවීම හා කරුණු පරීක්ෂාව වැනි 21 වැනි සියවසෙහි වැදගත් කුසලතා සංවර්ධනය කර ගැනීමට සුතත්‍ය ඉගෙනුම ශිෂ්‍යයන්ට උපකාරී වෙයි. එයට එක් හේතුවක් නම්, අලුත් සහ පැරණි විවිධ මෙවලම් ප්‍රයෝජනයට ගැනීමට එම ඉගෙනුම් ක්‍රමයේ දී ශිෂ්‍යයන් උනන්දු කරනු ලැබීම ය.

සියල්ල සාරාංශ කර දක්වන්නේ නම්, ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින අපගේ ලෝකයට ගැළපෙන පරිදි අපගේ සිසුන් සූදානම් කරන එක ම ඉගෙනුම් ක්‍රමය සුතත්‍ය ඉගෙනුම් ක්‍රමය යැයි නිගමනය කළ හැකි ය.

## සුතත්‍ය ඉගැන්වීම යනු කවරේ ද? (Authentic Teaching)

සුතත්‍ය ශික්ෂණ විද්‍යාව (Authentic Pedagogy) පළමුවෙන් ම නිර්වචනය කරන ලද්දේ, සුතත්‍ය ශිෂ්‍ය කාර්ය සිද්ධිය ප්‍රවර්ධනය කරන ඉගැන්වීම හා තක්සේරුකරණය ලෙසට ය. සුතත්‍ය ශිෂ්‍ය කාර්යසිද්ධීන් යන්නෙන් අදහස්

කෙරෙනුයේ වර්තමාන ශ්‍රම බලකායෙහි සිටින සාර්ථක වැඩිහිටියන් විසින් නිපදවනු ලබන නිර්මිත වැනි වැදගත් සුවිශේෂ හා අර්ථවත් සම්පාදනයන් ය. සුතත්‍ය ඉගැන්වීම සිදු වන්නේ, ඒවා පාදක කරගනිමින් ශිෂ්‍යයන් ඉගෙනුම් අත්දැකීම් ලබාගන්නා හා සැලසුම් කරන ආකාරය පිළිබඳ ව තොරතුරු ගුරුවරයා විසින් උපයෝගී කරගනු ලබන විට දී ය.

★ **නිර්වචනය :** සුතත්‍ය ශික්ෂණ ක්‍රම මගින් ශිෂ්‍යයන්ගේ චින්තනය සහ ගැටලු විසඳීමේ කුසලතාවන් සංවර්ධනය කෙරෙන අතර ම, ඉගෙනීමේ ක්‍රියාවලිය තුළ හඬක් නැගීමට ද, ශිෂ්‍යයන්ට අවස්ථාව සැලසෙයි. ඒ හැර, ඉගෙනුම් ක්‍රියාවලියෙහි ශිෂ්‍යයන් ක්‍රියාකාරී ව නිරතව සිටින විට දී, තමාගේ ඉගෙනීම පිළිබඳ වගකීම භාරගැනීමට ද ශිෂ්‍යයෝ අභිප්‍රේරණය වෙති **(Cornelius white & Harbaughk 2010)**. සහභාගිත්ව අත්දැකීම් සැලැස්වීමෙන් සහ ඒ සඳහා පහසුකම් සැලසීමෙන් හෝ ශාස්ත්‍රීය ''මෙහෙවර'' සඳහා මාර්ගෝපදේශ සැලැස්වීමෙන් ද, ගුරුවරු සුතත්‍ය ඉගෙනීම සඳහා වේදිකාව සකස් කරති.

ශිෂ්‍යයන් සමගින් ම ඉගෙනීමෙහි යෙදෙන අතරේ, ගුරුවරු බහුවිධ ඉගැන්වීමේ ක්‍රමෝපාය උපයෝගී කරගනිමින්, අඛණ්ඩ ප්‍රශ්න ඇසීම් සහ විශ්ලේෂණය ද සහිත පරිසරයක් පවත්වා ගෙන යති. තමන්ට ඉගෙනීමට අවශ්‍ය කුමක්දැයි ශිෂ්‍යයෝ දැන සිටින අතර ම, සුනම්‍ය කාල පරාමිතීන් ක්‍රියාත්මක කරමින්, කාර්යයෙහි රැඳී සිටීමේ වගකීම ද තමන් වෙත ම පවරා ගනිති.

දැනුම නිර්මාණය කිරීම (Construction of knowledge) යනු අත්දැකීම් ක්‍රියාකාරී ව සැකැසීම (processing) ය. එය නිර්වචනය කරනු ලබනුයේ පුද්ගලික වශයෙන් අර්ථවත් මෙන් ම සංකල්පමය වශයෙන් සංගත ද වන අයුරින් ඉගෙනුම්කරු විසින් තොරතුරු සහ ක්‍රියාවලීන් සමාග්‍රහණය කරගනු ලැබීම සහ තහවුරු කර ගනු ලැබීම යනුවෙනි **(Askew, 2013)**.

- **සුතත්‍ය ගුරුවරයා** (Authentic teacher): සුතත්‍ය ගුරුවරයා යනු, ශාස්ත්‍රඥයෙක් මෙන් ම ජීවන කුසලතා සහිත සහාය නිර්මාපකයෙක් ද (co-creator) වෙයි. නිර්මාණාත්මක, විවිධාංගික මනාව ව්‍යුහගත, කණ්ඩායම් පාදක, විවෘත ආන්තික (open ended), මිනුම් දඬු පාදක සහ ගෝලීය ව යොමු වුණු අධ්‍යාපන වැඩසටහන් මෙහෙයැවීමට අවශ්‍ය කුසලතා ගොනු සහ අත්දැකීම් ද සහිත ජීවිත කාලය පුරාම ඉගෙන ගන්නෙකි **(a life long learner) - (Revington, 2015)**.

- **සුතත්‍ය ඉගැන්වීමේ දී ගුරුවරයා සතු භූමිකාව:** සුතත්‍ය ඉගෙනීම, ඉගැන්වීම සහ තක්සේරුකරණය පිළිබඳ ව සමස්ත ක්‍රියාවලියෙහි ම තීරණාත්මක සංරචකය වනුයේ ගුරුවරයා ය. සාර්ථක සුතත්‍ය ගුරුවරයා පහත සඳහන් ආකාර විය යුතු ම ය.

i. ශිෂ්‍යයන්ගේ ශක්තීන් සහ දුර්වලතා තක්සේරු කළ යුතු අන්දම අවබෝධ කරගනිමින්, ඒ අනුව පාඩම් සැලසුම් කරයි.

ii. සාරවත් ප්‍රශ්න අසමින් සහ දැනුම අත්කර ගැනීමේ දී උපයෝගී කර ගැනීම සඳහා සාරවත් මූලසම්පත් සලස්වා දෙමින් සංවිධිත අන්දමින් ඉකුත් දැනුම මත, නව දැනුම ගොඩනැඟීම සඳහා ශිෂ්‍යයන්ට මඟ පෙන්විය යුතු අන්දම දැන සිටියි.

iii. ශිෂ්‍යයන් නව තොරතුරු ඇසුරින් තම අවබෝධය ගොඩනගා ගනිමින් සිටින විට දී, එම ක්‍රියාවලිය පෝෂණය කරන්නා බවට පත්වෙයි.

iv. පාසල් බිත්ති සීමාවෙන් බාහිර වූ ලෝකය සමඟ සම්බන්ධ වෙමින්, ශිෂ්‍යයන්ට තම ඉගෙනුම් අත්දැකීම් පුළුල් කර ගත හැකි අන්දම පිළිබඳ ව නිර්මාණශීලී වෙයි.

★ **සුතත්‍ය ශික්ෂණයෙහි ප්‍රමිතීන් (Standards of Authentic Instruction) ඃ**

i. **ඉහළ ගණයේ චින්තනය** (Higher order thinking) ඃ සුතත්‍ය ඉගැන්වීමෙහි ඉලක්කය වනුයේ, ශිෂ්‍යයන් ඉහළ ගණයේ චින්තනයට සහභාගි කරවීම ය. ඉහළ ගණයේ චින්තනය සඳහා ශිෂ්‍යයන් විසින් තොරතුරු සහ කල්පන හැසිරෙමින් ලැබිය යුත්තේ ඒවාහි අර්ථය සම්පූර්ණයෙන් ම වෙනස් වන ආකාරයෙනි. එ නම්, සංශ්ලේෂණය කිරීම, සාධාරණීකරණය කිරීම, පැහැදිලි කිරීම, උපකල්පනය කිරීම හෝ කිසියම් නිගමනයට හෝ අර්ථකථනයකට එළඹීම සඳහා ශිෂ්‍යයන් විසින් කරුණු සහ කල්පන සම්බන්ධනය කරනු ලබන ආකාරයෙනි. ඒ අන්දමින් තොරතුරු සහ කල්පන පැනවීම මගින් ගැටලු නිරාකරණය කිරීමට ද, නව අර්ථයන් සොයා ගැනීමට සහ නව අවබෝධයන් අත්කර ගැනීමට ද ශිෂ්‍යයන්ට අවස්ථාව සැලසෙයි.

ii. **දැනුමෙහි ගැඹුර** (Depth of knowledge) ඃ කල්පන මතුපිටින් නො ව, ගැඹුරින් අවබෝධ කර ගැනීමට සුතත්‍ය ඉගැන්වීම මගින් ශිෂ්‍යයන් මෙහෙය වනු ලබති. දැනුම ගැඹුරු හෝ ඝන හෝ වනුයේ එය කිසියම් මාතෘකාවක ප්‍රධාන කල්පන පිළිබඳ වූ විට ශිෂ්‍යයන්ට අදාළ ව නම්, දැනුම ගැඹුරු බවට පත් වන්නේ ඔවුන් විසින් විෂමතා පැහැදිලි ව හඳුනා ගනු ලබන විට දී, තර්ක ගොඩනඟා ගනු ලබන විට දී, ගැටලු විසඳනු ලබන විට දී මෙන් ම සාපේක්ෂ වශයෙන් සංකීර්ණ වූ අවබෝධයකින් යුතු ව කටයුතු කරනු ලබන විටදීත් ය - **(Gary A Newmann, 1993)**.

iii. **ලෝකය සමඟ සම්බන්ධතාව** (Connectedness to the word) ඃ සුතත්‍ය ඉගැන්වීමෙහි අගය සහ අර්ථය පන්ති සන්දර්භය ඉක්මවා බොහෝ ඈතට විහිද යයි. පාඩමක සුතත්‍යතාව වැඩිවනුයේ එය ශිෂ්‍යයන් ජීවත්

වන මහා සමාජ සන්දර්භයට වැඩියෙන් සම්බන්ධනය වන තරමට ය. ඉගැන්වීම කිසියම් මට්ටමකින් මහා සමාජයට සම්බන්ධනය වන අවස්ථා දෙකක් නිදසුන් වශයෙන් මෙසේ දැක්විය හැකි ය.

- ශිෂ්‍යයන් සැබෑ ලෝකයේ ජනතා ගැටලුවක් වෙත අවධානය යොමු කිරීම (උදා: නිවහනක් නොමැති ජනයාගේ ගැටලුව)
- ශිෂ්‍යයන් විසින් තම දැනුම භාවිතයෙහි යෙදීම සඳහා, පුද්ගලික අත්දැකීම් ප්‍රයෝජනයට ගනු ලබන විට දී (උදා: තමන්ගේ ම පාසලෙහි ගැටුම් නිරාකරණය සඳහා උත්සාහ ගැනීම) **(Gary & Newmann, 1993)**.

iv. **ප්‍රමාණවත් තරමේ සංවාදය** (Substantive Conversation): සුතත්‍ය ඉගැන්වීමේ අරමුණ වනුයේ, විෂයක සාරය ඉගෙනීමට සහ අවබෝධ කර ගැනීමට තුඩුදෙන අන්දමේ ඉහළ මට්ටමේ සංවාදයන් පවත්වා ගෙන යාම ය. එවැනි සංවාදයන්හි විශේෂ ලක්ෂණ තුනක් වෙයි.

* මාතෘකාවකට සම්බන්ධ කල්පන පිළිබඳ ව සැලකිය යුතු මට්ටමේ අන්තර්ක්‍රියාවක් (inter action) සිදු වේ.

* කල්පනයන්ට හවුල් වීම - සහභාගිකරුවා පූර්ණ වාක්‍ය මගින් තම මත ප්‍රකාශ කර සිටින විට ද, ප්‍රශ්න අසන විට ද, එසේ ම පූර්ව කථිකයන්ගේ මතවලට ප්‍රතිචාර දැක්වීමේ දී ද, කල්පනයන්ට හවුල් වීම සිදුවෙයි.

* සංවාදය ගොඩනැගෙනුයේ අදාළ තේමාව හෝ මාතෘකාව පිළිබඳ ව සාමූහික අවබෝධයක් ප්‍රවර්ධනය වන අයුරින් ය **(Gary & Newmann, 1993)**.

v. **ශිෂ්‍ය කාර්ය සිද්ධිය සඳහා සමාජයීය සහාය** : සුතත්‍ය ඉගැන්වීමේ දී සමාජයීය සහාය අනිවාර්යයෙන් ම ලැබිය යුතු ය. සියලු ම ශිෂ්‍යයන් සම්බන්ධයෙන් තමා තුළ ඉහළ මට්ටමේ අපේක්ෂාවන් ඇති බව ද, අභියෝගාත්මක ශාස්ත්‍රීය කාර්යන් ජයගැනීමට නම් දැඩි උත්සාහයක් දැරිය යුතු බව ද, වැදගත් දැනුම වර්ධනය කර ගැනීමට සහ වැදගත් කුසලතා ඇති කර ගැනීමට ද සියලු ම ශිෂ්‍යයන් තුළ හැකියාව තිබෙන බව ද, පන්තියෙහි සියලු ශිෂ්‍යයන් අතර අන්‍යෝන්‍ය ගෞරවයක් පවත්නේ නම් සියල්ලන්ගේ ම කාර්ය සිද්ධිය ඉෂ්ට වන බව ද ගුරුවරයා විසින් පැහැදිලි කර දෙනු ලබන පන්තිවල සමාජයීය සහාය ඉහළ මට්ටමක් ගනියි. අන්‍යෝන්‍ය ගරුත්වය (Mutual respect) යනු, කිසියම් විෂයයක් සම්බන්ධයෙන් එ තරම් කුසලතාවක් හෝ කාර්යක්ෂමතාවක් නොමැති ශිෂ්‍යයන් ද උනන්දු කිරීම සහ ඔවුන්ගේ දායකත්වයන් අගය කිරීම ය (**Gary & Newmann, 1993**.

## සුතත්‍ය තක්සේරුව (Authentic Assesment)

මෙම නිර්වචන වෙතින් පෙනී යන කරුණුවලට අනුව ''සුතත්‍ය තක්සේරු'' ප්‍රවේශයෙහි විශේෂත්වය වන්නේ, සැබෑ ලෝකයෙහි සැබෑ කාර්යන් සම්බන්ධයෙන් සිසුවා තමා ලද දැනුම ආකල්ප හා කුසලතා කොතරම් ඵලදායී ව යොදා ගැනීමට සමත් වන්නේදැයි මැනීමයි. මෙම තක්සේරුවට අනුව, යථාර්ථවාදී ගැටලුවලට පිළිතුරු සපයන සිසුහු නිර්මාණශීලී ව හඳුනා ගැනීමට අවශ්‍ය හැකියා වර්ධනය කර ගනිති.

සුතත්‍ය තක්සේරුව හැඳින්වීම සඳහා භාවිත කෙරෙන වෙනත් නම් දෙස බැලීමෙන් ද, එම ක්‍රමය පිළිබඳ ව කිසියම් වැටහීමක් ඔබට ලබාගත හැකිවනු ඇත. ඒවා නම්,

- කාර්ය සාධන තක්සේරුව (Performance Assessment) : එසේ හඳුන්වනු ලබන්නේ, අර්ථවත් කර්තව්‍යයන් සාධනය කිරීමට ශිෂ්‍යයන්ට නියම කරනු ලබන හෙයිනි.
- විකල්ප තක්සේරුව (Alternative Assessment): එසේ හඳුන්වනු ලබන්නේ සුතත්‍ය තක්සේරු ක්‍රමය යනු සම්ප්‍රදායික තක්සේරු ක්‍රමයට විකල්පයක් හෙයිනි.
- ඍජු තක්සේරුව (Direct Assessment): එසේ හඳුන්වනු ලබන්නේ, දැනුම සහ කුසලතා භාවිතයෙහි යෙදීම හා සම්බන්ධ ඍජු සාක්ෂි එම ක්‍රමය මගින් දක්නට ලැබෙන හෙයිනි. අනිත් අතට, සුතත්‍ය තක්සේරුවට මූලික වනුයේ පහත සඳහන් තර්කන සහ භාවිතයන් ය.

1. පාසලක මෙහෙවර වනුයේ ඵලදායී පුරවැසියන් බිහි කිරීම ය.
2. ඵලදායී පුරවැසියකු වීමට නම්, සැබෑ ලෝකය තුළ අර්ථාන්විත කර්තව්‍යයන් සාධනය කිරීමට ඔහු සමත්විය යුතු ය.
3. එම නිසා, අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසු ව මුහුණ පෑමට සිදු වන කර්තව්‍යයන් සාධනය කිරීමේ හැකියාව පාසල් මගින් ශිෂ්‍යයාට ලබාදිය යුතු ය.
4. අරමුණු සාර්ථක ව තිබේ දැයි නිර්ණය කර ගනු සඳහා, සැබෑ ලෝකයේ අභියෝග අනුකරණය කෙරෙන අර්ථවත් කර්තව්‍යයන් සාධනය කර පෙන්වීමට, ශිෂ්‍යයන් යොමු කළ යුතු ය.

ඒ අනුව සාම්ප්‍රදායික තක්සේරු ක්‍රමයේ දී තක්සේරුව විසින්, විෂයමාලාව මෙහෙයවනු ලබයි. එනම්, තම නිපුණතාව සනාථ කරනු සඳහා ශිෂ්‍යයන් සාධනය කළ යුතු කර්තව්‍යයන් ගුරුවරුන් විසින් මුලින් ම නිර්ණය කරනු ලබයි. ඉන් පසු ව එම කර්තව්‍යයන් සාධනය කිරීමේ හැකියාව අත්කර දෙන විෂයමාලාව, ගුරුවරුන් විසින් නිර්ණය කෙරෙයි. මෙය හඳුන්වනු ලබන්නේ පසුපසට සැලසුම් කිරීම (Planning backwards) යනුවෙනි.

ඉහත දක් වූ උපලක්ෂණ අනුව සුතත්‍ය තක්සේරුවේ හඳුනාගත් පොදු ලක්ෂණ කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.

1. පූර්ව නිශ්චිත විකල්ප (බහුවරණ වැනි) තේරීම් වෙනුවට යම් කාර්ය අභියෝග යක් ම මුහුණ දී ප්‍රතිචාර දක්වීමට සැලැස්වීමෙන් දැනුම වර්ධනය කර ගැනීමට අපේක්ෂා කරයි.

2. මූලික කුසලතා හා නිපුණතාවලට අමතර ව ඉහළ මට්ටමේ චින්තනය මැනීමට අපේක්ෂා කරයි.

3. කොටස් වෙන් වෙන් වශයෙන් නො ව සමස්ත ව්‍යාපෘතිය ම ඍජු ව ම තක්සේරුකරණය කරයි.

4. කාර්ය සාධනයේ දී පන්තිකාමරයෙන් ලද ඉගෙනුම නිර්මාණශීලී ව භාවිතයට හුරුකම් ලබයි.

5. ශිෂ්‍යයා පෞද්ගලික සුවිශේෂතා, ස්වභාවික බව හා නම්‍යශීලී බව කෙරේ සැලකිල්ල දක්වයි.

6. බහුවිධ කෝණවලින් බලා විනිශ්චයන්ට පැමිණීමට ඉඩ හරියි.

7. සැබෑ ලොව මුහුණ දෙනු ලබන තත්වයන් පිළිබඳ ව සොයා බලයි.

8. ශිෂ්‍ය ක්‍රියාකාරීත්වය ඍජු ව ම තක්සේරු කරයි.

9. දැනුමෙහි මැන බැලෙන්නේ කුමන කොටසද්දැයි ශිෂ්‍යයා කලින් ම දැන සිටින නිසා විශාල පරාසයකට තම දැනුම විහිද වීමට කටයුතු කරයි.

10. සක්‍රීය ඉගෙනුමකට යොමු වෙයි.

11. බුද්ධි කලම්බනය කරයි.

12. තක්සේරුව සිසු හැකියා, බුද්ධි මට්ටම් හා වයසට ගැළපෙයි **(නානායක්කාර, 2011).**

## සුතත්‍ය තක්සේරු උපකරණයක තිබිය යුතු ලක්ෂණ

සුතත්‍ය තක්සේරු උපකරණයක් සැකසීමේ දී ගුරුවරයා තමා විසින් අසාගත යුතු ප්‍රශ්න කිහිපයකි. එ නම්,

i. ඉගැන්වීමේ දී ශිෂ්‍යයා තුළ ගොඩනැඟිය යුත්තේ කවර දැනුමක් ද? කවර ආකල්ප ද? කවර කුසලතා ද?

ii. එහි දී සිසුන් ඒවා ග්‍රහණය කර ගන්නේ කෙසේ ද?

iii. අවශ්‍ය තැන්හි මා ඔවුන්ට උදව් කරන්නේ කෙසේ ද?

මෙබඳු ප්‍රශ්න තමා වෙතින් ම අසා ගන්නා ගුරුවරයා, ශිෂ්‍යයන් වෙත ළඟා කළ යුතු නිපුණතාව කුමක්ද යි තීරණය කළ යුතු වේ. ඉන් අනතුරු ව අවශ්‍ය තක්සේරු උපකරණ ගොඩ නැංවීම කළ යුතු වේ. එ වැනි සුදුසු තක්සේරු උපකරණයක තිබිය යුතු ලක්ෂණ කිහිපයක් පහත දැක් වේ.

1. මූලික වශයෙන් ම තක්සේරුව ශිෂ්‍ය කේන්ද්‍රීය විය යුතු ය.
2. ගුරුවරයා විසින් අධීක්ෂණය හෝ නියාමනය කරමින් අවශ්‍ය උපදෙස් සපයමින් තක්සේරු ව සිදුකළ යුතු ය.
3. එසේ ම එය ස්වයං ඇගයුමට පොලඹවන සුලු එකක් විය යුතු ය.
4. සිසුන්ට ප්‍රිය උපදවන්නක් විය යුතු ය.
5. සිසුන්ට ප්‍රතිඵලදායක එකක් විය යුතු ය.
6. සිසුන්ගේ කාර්ය සාධනය මැනිය හැකි එකක් විය යුතු ය.
7. සිසුන්ගේ නිර්මාණශීලීත්වයට හේතුවන්නක් විය යුතු ය.
8. ශිෂ්‍ය සාධනය වර්ධනය කරන්නක් විය යුතු ය.
9. ශිෂ්‍ය හැකියාවන් හා බුද්ධියට සරිලන්නක් විය යුතු ය.
10. අදාළ චර්යාවන් නිරීක්ෂණය කළ හැකි විය යුතු ය.
11 ප්‍රතිපෝෂණයට හා ප්‍රතිචාරයට අවස්ථාවක් තිබිය යුතු ය.
12. තක්සේරුකරණයෙන් ඔබ්බට ජීවිතයට සම්බන්ධ කරගත හැකි විය යුතු ය.
13. අනම්‍ය නො ව සුනම්‍ය වූ ක්‍රියාකාරකමක් විය යුතු ය.
14. සමෝධානික ක්‍රියාකාරකමක් විය යුතු ය.
15. කෘත්‍රිම නො ව සැබෑ ජීවිත අත්දැකීමක් හා සම්බන්ධ එකක් විය යුතු ය.
16. ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත එකක් විය යුතු ය.

මේ ආදි විවිධ ලක්ෂණයන් රාශියකින් යුක්ත තක්සේරුකරණයක් සුනම්‍ය තක්සේරුකරණය සඳහා යොදා ගන්නා උපකරණයක පැවතිය යුතු වේ. ඉන් අදහස් කරන්නේ මේ සියලු ලක්ෂණ එම උපකරණය තුළ තිබිය යුතු බව නො ව ඉන් කිහිපයක්වත් පැවතිය යුතු බව යි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අබේපාල, රෝලන්ඩ්(2020) **සුනත්‍ය ඉගෙනුම**, සාර ප්‍රකාශන, කොට්ටාවඃ

**Authentic Learning (n.d) The Glossary of education Reform Retrieved** from http:// edglossary.org/authentic -learning.

**Authentic Teaching Erin Daily**, University of Wisconsin-River falls, Download-04.05.2020.

**Authentic Assessment Toolbox** created by Jan Micller, What is Authentic Assessment?.

**Educator Advisory**, Authentic Learning is much, much more then That, Authentic Learning for the 21st Century.

Egon G. Guba and Yvonna S. Lincoln (1989), **Fourth Generation Evaluation**.

Maina, F.(2004), **Authentic learning Perspectives fro**, contemporary educators, Journal of Authentic Learning Retrieved.

Steve Revington (2016), **Hierarchy of Instructional Skill Development**.

**User Generated Education**, Education as it should be-passion-based Authentic Learning Experience.

www.acel.org.au e. **Teaching, Management Stratecies for the Classroom**, Authentic learning: What, Why and how?